රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:13/2005

මගේ අංකය:ආ4/3/1/14-1
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2005 ජූලි මස 28 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක, සහන සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් ස්ථිර කිරීම

රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක, සහන සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සියළුම සේවකයින් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරන්නේ නම් 2005.07.01 දින සිට සේවයේ ස්ථිර කළ යුතු යයි රජය තීරණය කර ඇත.

i. අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය.

ii. අනුමත සේවක සංඛ්‍යාවට අයත් දැනට පුරප්පාඩුව පවත්නා ස්ථිර තනතුරේ 2005.06.30 දිනට (වැඩ කරන) දින 180 ක් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව සේවය කර තිබිය යුතුය. රජයේ නිවාඩු දින හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කළ යුතු තනතුරක සේවය කරන නිලධාරියෙකු එම දිනවල සේවය කළ දිනයන් දින 180 ගණනය කිරීමේදී අදාළ කර ගත යුතු වේ.

iii. තනතුරට අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

iv. 2002.10.01 සහ 2002.10.24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 16 සහ 16(1) නිකුත් කිරීමෙන් පසුව ඉහත පදනම මත කරන ලද පත්කිරීමක් නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියක් ලැබී තිබිය යුතුය.

v. මේ යටතේ ස්ථිර කිරීමට සුදුසුකම් ලබන සේවකයින්ගේ වයස **2005.06.30** දිනට අවුරුදු **45** ඉක්මවා තිබුණද ඔවුන් තාවකාලික, අනියම්, ආදේශක, සහන සහ කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී වයස අවුරුදු **45** ඉක්මවා නොතිබුනේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කළ හැකිය.

**02.** ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන සියළුම සේවකයන් ස්ථිර සේවයට පත් කිරීම සඳහා අදාල පත්කිරීම් බලධාරියා විසින් කටයුතු කළයුතුය.

**03.** චක්‍රලේඛය නිකුත් කරනුයේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය



ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය